Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සති පාසල

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය :

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

(1) තනි පුද්ගල ව්‍යාපාර හා සැසඳීමේ දී හවුල් ව්‍යාපාරයක අවාසියක් වන්නේ,

(1) ලාභය හවුල්කරුවන් අතර බෙදා හැරීමට සිදුවීම.
(2) ලාභය තනි ව භුක්ති විඳිය හැකි වීම.
(3) තනි ව තීරන ගත හැකි වීම.
(4) ආරවුල් ඇති නොවීම.

(2) තනි පුද්ගල හා හවුල් ව්‍යාපාරවල දැකිය හැකි වාසි සහගත ලක්ෂණයක් වන්නේ,

(1) වගකීම සීමිත වීම. (2) නීතිමය පුද්ගල භාවයක් ලැබීම.
(3) අඛණ්ඩ පැවැත්ම (4) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.

(3) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වඩාත් පිළිගත හැකි ක්‍රමය වන්නේ,

(1) වාචික ව (2) ලිඛිත ව (3) ඇඟවීමෙන් (4) පවුලේ ආභාසයෙන්

(4) අනිල්, බැසිල්, සිසිල් ගිවිසුමකින් තොර ව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. සිසිල් ඉවත්ව යෑමට තීරණය කරන ලදී. මෙහි දී හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් තීරණය කිරීමට අනුගමනය කළ යුත්තේ,

(1) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත (3) 1890 හවුල් ආඥා පනත
(2) 2007 අංක 07 දරන සමාගම් පනත (4) 1982 අංක 17 දරන සමාගම් පනත

(5) හවුල් ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) නීතිමය බලපෑම් වැඩි වීම. (2) විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
(3) අඛණ්ඩ පැවැත්මක් නැති වීම. (4) අයිතිය පාලනයෙන් බැහැර වීම.